සැ. යු. — (i) 2015.02.06 දින පළ වූ අංක 1,901 දරන ගැසට් පත්‍රයේ III සහ IV(අ) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2010.06.28 දින සිට 2013.12.31 වැනි දින දක්වා වූ කාලසීමාවට අදාල පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාමලේඛනයක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,902 - 2015 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා - 2014.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 472 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 486 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 489 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මාර්තු මස 06 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 පෙබරවාරි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## හැටන් දික්ඔය නගර සභාව

හැටන් දික්ඔය නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | මුරකරු | 01 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (රා. ප. ච. 6/2006 (IV) PL1 2006 (A) වැටුප් පරිමාණයේ I පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05 එක් වරක දී සමත්ව තිබිය යුතු ය. |
| 02 | වැඩ/ක්ෂේත්‍ර (කර්මාන්ත) කම්කරු | 08 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (රා. ප. ච. 6/2006 (IV) PL-1 2006 (A) වැටුප් පරිමාණයේ I පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05 එක් වරක දී සමත්වී තිබිය යුතු ය. |
| 03 | ක්‍රීඩාභූමි උපදේශක | 01 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (රා. ප. ච. 6/2006 (IV) PL-1 2006 (A) වැටුප් පරිමාණයේ I පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05 එක් වරක දී සමත්වී තිබිය යුතු ය. |

*කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් සහ යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

*වෙනත් :*

1. අයදුම්කරු හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.)
2. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
3. බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
4. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.
5. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම හැටන් දික්ඔය නගර සභාවේ ලේකම් සතුය.
6. යම් හෙයකින් අදාළ සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුනේ නම් හැටන් දික්ඔය නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලබන අතර ඒ පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.
7. හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමානව තෝරා ගැනීමට සුදුස්සන් ප්‍රමාණවත් නොවූ විටක යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමට සභාවේ ලේකම්ට බලය ඇත.

*වයස :*

* අවම : අවුරුදු 18
* උපරිම : අවුරුදු 45
(අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින ස්ථිර තනතුරු දරන අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

*බඳවා ගැනීමේ ක්‍රමය ඃ*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙළට අනුව පවතින පුරප්පාඩුවලට පත් කරනු ලැබේ.

* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර ඃ

| | |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 |
| පළපුරුද්ද | 55 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 |

* *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි ඃ-*

1. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය ;
2. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ ;
3. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ ;
4. III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් ගත වීමට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම ද, II ශ්‍රේණියට උසස් වී වසර තුනක් ගත වීමට පෙර 2 වන කාර්යක්ෂමතා කඩඉම ද, I වන ශ්‍රේණියට උසස්වී වසර පහක් ගත වීමට පෙර 3 වන කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතුය ;
5. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන අනුව එක් එක් තනතුරට අවශ්‍ය අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීමේ දින සිට වසර පහක් තුළදී ලබා ගත යුතුය. එලෙස සුදුසුකම සම්පූර්ණ කිරීමට අපොහොසත් වන තැනැත්තන්ගේ වැටුප් වර්ධක නතර කරනු ලැබේ;
6. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ මධ්‍යම පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම්කළ යුතු ආකාරය ඃ*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2015.03.04 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, හැටන් දික්ඔය නගර සභාව, හැටන් " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර"................................................" යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල හැටන් දික්ඔය නගර සභාවේ ලේකම් සතුය.

* අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

- උප්පැන්න සහතිකය,
- අධ්‍යාපන සහතික,
- මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනුඅත්සන් කර තිබිය යුතුය),
- මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්,
- වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
- සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
හැටන් දික්ඔය නගර සභාව,
හැටන්.

2015 ජනවාරි මස 20 වැනි දින,
හැටන් දික්ඔය නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*.......................................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
3. තැපැල් ලිපිනය :——————————.
4. දුරකථන අංකය :——————————.
5. උපන් දිනය ; වර්ෂය:——————. මාසය:——————. දිනය:——————.
6. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ; අවුරුදු :——————.මාස:——————. දිනය:——————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
9. විවාහක/අවිවාහක බව :——————————.
10. ජාතිය :——————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————.
12. *අධ්‍යාපන සුදුසුකම් ;*

| *විෂයය* | *සමර්ථය* |
|---|---|
| | |

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.
14. ඔබ දැනටමත් හැටන් දික්ඔය නගර සභාවේ සේවය කරන්නේ නම් ;
    - (i) දැනට දරන තනතුර :——————————.
    - (ii) එම තනතුර පත්වූ දිනය:——————————.
    - (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත ද):——————.
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද? :——————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවුත් හා නිවැරදිවුත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ;*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන.................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ.............................................. වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
තනතුර :——————————.
නිල මුද්‍රාව:——————————.

02-250/1

## හැටන් දික්ඔය නගර සභාව

හැටන් දික්ඔය නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | ඖෂධ සංයෝජක | 01 | රු.12,210 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු. 18,600 (රා.ප.ච. 6/2006 (iv) P L2 2006 (A) වැටුප් පරිමාණයේ I පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |

*පොදු සුදුසුකම් :*

1. ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය ;
2. අයදුම්කරු හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශය තුළ අඛණ්ඩව වසර 03 ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.);
3. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය;
4. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් සභා රාජ්‍ය සේවයක නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමා අදාළ නොවේ);
5. හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන තෝරා ගැනීමට සුදුස්සන් ප්‍රමාණවත් නොවූ විටක යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයඳුම්පත් කැඳවීමට සභාවේ ලේකම්ට බලය ඇත ;
6. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය ;
7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදන අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම හැටන් දික්ඔය නගර සභාවේ ලේකම් සතුය ;
8. යම් හෙයකින් අදාළ සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුනේ නම් හැටන් දික්ඔය නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලබන අතර ඒ පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

1. අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කරගෙන තිබිය යුතුය.

* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) හෝ 3 වන මට්ටමේ (NVQ3) සහතිකය ලබා තිබීම ;

*හෝ*

* කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙ පාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම ;

*හෝ*

* ජාතික තරුණ සේවා සභාවේ (NCSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම

*හෝ*

* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම,

*හෝ*

* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම ;

*හෝ*

* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

*පළපුරුද්ද :*

අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02 ක් වත් විය යුතුය.)

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

** සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.
3. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

4. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ මධ්‍යම පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.
5. III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් ගත වීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම ද, II වන ශ්‍රේණියට උසස් වී වසර තුනක් ගත වීමට පෙර 2 වන කාර්යක්ෂමතා කඩඉම ද, 1 වන ශ්‍රේණියට උසස්වී වසර තුනක් ගත වීමට පෙර 3 වන කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතුය.
6. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු සේවකයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන අනුව එක් එක් තනතුරට අවශ්‍ය අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පත්වීමේ දින සිට වසර පහක් තුළදී ලබා ගත යුතුය. එලෙස සුදුසුකම සම්පූර්ණ කිරීමට අපොහොසත් වන තැනැත්තන්ගේ වැටුප් වර්ධක නතර කරනු ලැබේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය* :

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2015.03.04 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, හැටන් දික්ඔය නගර සභාව, හැටන් " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර"............................................'" යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල හැටන් දික්ඔය නගර සභාවේ ලේකම් සතුය.

* අයදුම්පත සමග පහත සහතික වල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

- * උප්පැන්න සහතිකය,
- * අධ්‍යාපන සහතික,
- * මෑතක දී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.),
- * මෑතක දී ලබාගත් චරිත සහතික 2 ක්,
- * වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
- * සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
හැටන් දික්ඔය නගර සභාව, හැටන්.

2015 ජනවාරි මස 20 වැනි දින,
හැටන් දික්ඔය නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

............................................................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
3. තැපැල් ලිපිනය :——————————.
4. දුරකථන අංකය :——————————.
5. උපන් දිනය : වර්ෂය :——————————. මාසය :——————————. දිනය :——————————.
6. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————————. මාස :——————————. දින :——————————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
9. විවාහක/අවිවාහක බව :——————————.
10. ජාතිය :——————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.
12. අධ්‍යාපන සුදුසුකම් :

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :—————————.
14. ඔබ දැනටමත් හැටන් දික්ඔය නගර සභාවේ සේවය කරන්නේ නම් -

(i) දැනට දරන තනතුර :—————————.
(ii) එම තනතුරට පත් වූ දිනය :—————————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මතද) :—————————.

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද? :—————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

—————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන.................................................................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ.............................................. වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————————.
තනතුර :—————————.
නිල මුද්‍රාව :—————————.

02-250/2

---

**වත්තේගම නගර සභාව**

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාව සඳහා රියදුරු/ජල කම්කරු/ ආදාහනාගාර ක්‍රියාකරු/ආදාහනාගාර ක්‍රියාකරු සහායක තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති වත්තේගම නගර සභා සීමාව, පාතදුම්බර හා පන්විල ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2015.03.04 දින හෝ ඊට පෙර "ලේකම්, වත්තේගම නගර සභාව, වත්තේගම" ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ වත්තේගම නගර සභාවේ (ඉල්ලුම්කරන තනතුර) සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. (වත්තේගම නගර සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, ආදේශක සේවකයින්ට හා නගර සීමාව තුළ පදිංචි කරුවන් වෙත ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.)

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| රියදුරු III පන්තිය | 02 | 06/2006 iv PL-3-3- 2006A රු. 12,470 - 130 x 10 145x10 - 60 x 10 - 170 x 12 රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබීම ;<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුනතාවය පිළිබඳ වලංගු බලපත්‍රය C, C1, D, D1 කාණ්ඩ සඳහා ලබා තිබීම; හා |

| තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| | | | දිවා හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් යෝග්‍ය තත්වයෙන් තිබිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය ; හා මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය.) හා අවම උස අඟල් 625 ක් විය යුතුය. |
| ජල කම්කරු | 02 | 06/2006 iv - PL1 රු.11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 - රු. 17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ)විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. |
| ආදාහනාගාර ක්‍රියකරු | 01 | 06/2006 iv PL2 රු. 12,210 - 130 x 10 - 145 x 10 - 160 x 10 - 170 x 12 රු. 18,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. වෘත්තීය පිළිබඳ ශිල්පීය සහතික ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| ආදාහනාගාර ක්‍රියාකරු සහායක | 01 | 06/2006 iv -PL1 රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12- රු. 17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. |

*රියදුරු තනතුරු සඳහා බඳවා ගැණීමේ ක්‍රමය :*

1. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.
2. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන්නාවූ අයදුම්කරුවන් පත් කිරීමට පෙර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථ ප්‍රවාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද, එක් මාණ්ඩලික නිලධාරියෙකුගෙන් ද, සමන්විත තිදෙනෙකුට නොඅඩු පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
3. සේවයට බඳවා ගැනීම අදාළ පළාත් පාලන ආයතනයේ පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

*අනෙකුත් තනතුරුවලට බඳවා ගැනීමේ ක්‍රමය :*

මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
* එසේම රාජ්‍ය සේවා පත් කිරීම් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.
* රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියාකළ යුතුයි.
* තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්වයක නොමැති වුවහොත් ඉවත් කරනු ලැබේ.
* බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*වෙනත් පොදු කොන්දේසි :*

* ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අදාල නගර සභා/ප්‍රාදේශීය සභා සීමාවන් තුල යටත් පිරිසෙයින් වසර 03 කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය.

* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
* අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.
* විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුලත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය.
* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වත්තේගම නගර සීමාව තුළ යටත් පිරිසෙයින් වසර 03 කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය)
* රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුය.
* රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05 ක කාලය තුළ වරදකට (අවවාද කිරීම හැර) දඬුවමක් ලබා නැත්තා වූද, මෙම කාලය තුළ යෙදුන වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තා වූ ද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතුය.
* වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අයදුම්කරු ත්‍රිවිධ හමුදාව හා ආරක්ෂක සේවයේ නිරත වී සිට විධිමත් පරිදි සේවයෙන් මුදා නොහැරිය අය නොවිය යුතුය.
* මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද, මධ්‍යම පළාත් සභාව හෝ වත්තේගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
* මෙම බඳවා ගැනීම් නිවේදනය විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද වත්තේගම නගර සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

*අයදුම්කළ යුතු ආකාරය ඃ*

මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් සහතිකවල ඡායාස්ථ පිටපත් සමඟ 2015.03.04 දිනට ප්‍රථම මා වෙත ලැබෙන්න සලස්වන්න.

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික හා වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික;
3. පදිංචිය පිළිබඳව ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ යුතුය.)
4. මෑතකදී ලබාගත් චරිත සහතිකය.

පී. එස්. බී. මඩුගල්ලේ,
ලේකම්,
වත්තේගම නගර සභාව,
වත්තේගම.

2015 ජනවාරි මස 22 වැනි දින දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම
වත්තේගම නගර සභාව

....................................................... තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම :——————————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
02. ස්ථිර ලිපිනය:——————————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
05. උපන් දිනය ඃ වර්ෂය:——————————.මාසය:——————————. දිනය:——————————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස:——————————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
08. විවාහක/අවිවාහක බව:——————————.
09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද ලියාපදිංචි වීමෙන්ද යන වග:——————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල පිටපත් ඇමිණිය යුතුය.):——————————.

අ.පො.ස. (සා. පෙළ) විහාගය :———————————.
සමත් වර්ෂය:———————————. විහාග අංකය:———————————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | 5.<br>6.<br>7.<br>8 | |

11. (1) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :———————————.
(2) වෘත්තීය සුදුසුකම් :———————————.
(3) සේවා පළපුරුද්ද :———————————.
12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුරු :———————————.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක යන වග ද :———————————.
එම තනතුරට පත් වූ දිනය:———————————.
13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

එසේ නම් ඒ පිළිබඳ විස්තර:———————————.

———————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන.................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත්‍ර නිර්දේශ කර ඉදිරිපත් කරමි.

———————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :———————————.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

02-251

---

**මාතර ප්‍රාදේශීය සභාව**

මාතර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම් වෘත්තීය සුදුසුකම් හා පුරුද්ද* | *පොදු සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර පරිපාලක | 01 | රා. ප. ච. 06/2006 අනුව MN1 - 2006A | අ.පො.ස. (සා.පෙ) විහාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 ක් සමත් වීම | * ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.<br>* විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.<br>* පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අවම අධ්‍යාපන සුදුසුකම් වෘත්තීය සුදුසුකම් හා පුරුද්ද | පොදු සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | ලියවිල්ලකින් පදිංචිය සනාථ කල යුතුය.<br>* තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |
| 02. | සෞඛ්‍ය පරිපාලක | 01 | රා.ප.ච. 06/2006 අනුව MN1-2006A | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් වීම | |
| 03. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රා.ප.ච. 06/2006 අනුව MN1-2006A | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වීම | |
| 04. | සෞඛ්‍ය කම්කරු | 01 | රා.ප.ච. 06/2006 අනුව MN1-2006A | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වීම. | |
| 05. | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | රා.ප.ච. 06/2006 අනුව MN2-2006A | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 සමත් වීම.<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුනතාවන් ලැබීම අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. | |
| 06. | ආදාහනාගාර සහායක | 01 | රා.ප.ච. 06/2006 අනුවMN 1-2006A | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මනා 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම | * ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.<br>* විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. |
| 07. | ජල වැද්දුම්කරු | 01 | රා. ප. ච. 06/2006 අනුව MN2-2006A | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් සමත් වීම<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුනතාවන් ලැබීම අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. | * පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කල යුතුය.<br>* තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |

*වෙනත් :-*

01. මාතර ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
02. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
03. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
04. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මාතර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :-*

01. සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලැබේ.
02. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. වැන්දඹු අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
03. පත්වීම් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
04. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද මුදල් රෙගුලාසිවලටද දෙපාර්තමේන්තු නියෝගවලටද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම් කරන ආකාරය :-*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2015.03.19 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, මාතර ප්‍රාදේශීය සභාව, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතික
03. පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.)
04. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්
05. පළපුරුද්ද පිළිබඳ සහතික
06. මාතර ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්

පී. ජී. පියල් රණදේව,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 26 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභාව මාතර.

........................................ *තනතුර සඳහා අයදුම්පත*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග නම) :————————————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————.

03. ස්ථිර පදිංචි ලිපිනය :————————————.

04. දුරකථන අංකය :————————————.

05. දිස්ත්‍රික්කය :————————————.

06. උපන් දිනය වර්ෂය :————————. මාසය :————————. දිනය :————————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————————.

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස
අවුරුදු :————————. මාස :————————. දින :————————.

09. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.

10. විවාහක/අවිවාහක බව :————————.

11. ජාතිය :————————.

12. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග (එසේ නම් පරම්පරාවෙන්/ලියාපදිංචි වීමෙන් ද) :————————.

13. අධ්‍යාපන සුදුසුකම්

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

14. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————.

15. ඔබ දැනටමත් මාතර ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්

* දැනට දරන තනතුර
* එම තනතුරට පත් වූ දිනය
* එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මතද)

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————————.

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන............................. මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ....................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර/නිර්දේශ නොකර ඉදිරිපත් කරමි.

————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය :————————.

02-309

**කොළඹ මහ නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ 111 වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2015

කොළඹ මහ නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට පහත සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ කාන්තා හා පිරිමි පුරවැසියන් වෙතින් අයදුම්පත් 2015.02.27 වන දින දක්වා මවිසින් භාරගනු ලැබේ.

පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම්කිරීමේ දී මේ සමඟ පළවී ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය පරිදි ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තෙහිම යතුරු ලියනය කර හෝ පැහැදිලි අත් අකුරින් පිළියෙල කරගත් අයදුම්පත් මගින් අයදුම් කළ යුතුය. අයදුම්පත් "නාගරික කොමසාරිස්, නාගරික කොමසාරිස් කාර්යාලය, කොළඹ මහ නගර සභාව, පුරහල, කොළඹ 07" යන ලිපිනයට 2015.02.27 වන දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩු කෙළවරේ "බ.ප. රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම්පත" ලෙස සඳහන් කළ යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වැඩිදුර විස්තර නාගරික ලේකම් විමසා ලබාගත හැකිය.

1. *තනතුරු නාමය :* බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ තනතුර

2. *මාසික වැටුප් පරිමාණය :* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) PL-01-2006A
   රු.11,730-10x120-10x130-10x145-12x160-17,600
   ආරම්භක මාසික වැටුප රු. 11,730.
   රු. 12,090 හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

3. (i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.
   (ii) වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
   (iii) මෙම තනතුර වසර 03ක පරිවාස කාලයකට යටත්වේ.

4. *පොදු සුදුසුකම් :-*

   (i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
   (ii) මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
   (iii) අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

5. *අධ්‍යාපන සුදුසුකම් :-*

   (i) මාර්ග කම්කරුවන් හා සනීපාරක්ෂක/සෞඛ්‍ය කම්කරුවෙන් හැර III පංතියට ඇතුලත් කර ඇති සෙසු තනතුරු සඳහා අවම වශයෙන් 8 වන ශ්‍රේණිය /9 වසර සමත් ව තිබිය යුතුය.
   (ii) මාර්ග කම්කරුවන් :- අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වැනි වසර සමත්වී තිබිය යුතුය.
   (iii) සනීපාරක්ෂක කම්කරුවන්/සෞඛ්‍ය කම්කරුවන් :-
   අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ.

6. *වයස් සීමාව :-*

   (i) අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

8. *තනතුරට අදාලව බලපාන සේවා කොන්දේසි :-*

   (i) මෙම තනතුරේ රාජකාරි කාලය දිනකට පැය 8.45කි.
   (ii) සේවා අවශ්‍යතාවය මත දිවා සහ රාත්‍රී කාලවල සේවය කිරීමට සිදුවේ.
   (iii) රාජකාරියේ යෙදෙන විට තනතුරට නියමිත නිල ඇඳුමෙන් සැරසී සිටිය යුතුය.

9. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

අංක 24/95 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

10. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් අවසාන තීරණය පත්වීම් බලධාරියා සතුවේ.

වී. කේ. ඒ. අනුර,
නාගරික කොමසාරිස්,
කොළඹ මහ නගර සභාව.

2015 පෙබරවාරි මස 13 වැනි දින,
නාගරික කොමසාරිස් කාර්යාලය,
කොළඹ මහා නගර සභාව,
පුරහල, කොළඹ 07.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

*ආදර්ශ අයදුම්පත්‍රය*

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම්පත***

1. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

2. මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :——————————.

3. මුලකුරු වලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

4. 1. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :——————————.

 2. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

 3. තාවකාලික ලිපිනය (සිංහලෙන්) :——————————.

5. උපන් දිනය ፡ අවුරුද්ද: මාසය: දිනය:

6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ፡ අවුරුදු : මාස: දින:

7. ජාතික හැඳුනුම්පත් අංකය:

 (උප්පැන්න සහතිකයේ, සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය.)

8. විවාහක/අවිවාහක බව :——————————.
9. දුරකථන අංක ፡ පෞද්ගලික/ කාර්යාලීය :——————————.
10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාලසීමාව :——————————.
 (ග්‍රාම සේවා සහතිකය අමුණා සනාථ කළ යුතුය.)
11. අධ්‍යාපන සුදුසුකම් :——————————.
 (සුදුසුකම් සහතික කිරීමට අදාළ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
12. වෘත්තීය සුදුසුකම් : (තිබේ නම් පමණි) ——————————.
13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත් ) :——————————. (සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායාපිටපත් ඇමිණිය යුතුය.)
14. (i) ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද ? (ඔව්/නැත):——————————.
 (ii) ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද ?:——————————.
15. ඔබ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් මීට පෙර සේවයෙන් පහකළ හෝ ඉල්ලා අස්වූ තැනැත්තෙක් ද ? (ඔව්/නැත) :——————————.
16. (i) දැනට දරන තනතුර (සිංහලෙන්) :——————————.
 (ii) එම තනතුරට පත්වූ දිනය :——————————.
 (iii) සේවය කරන දෙපාර්තමේන්තුව/අංශය :——————————.

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා III වන ශ්‍රේණියේ කාර්යාල සේවක සේවයේ තනතුරකට නුසුදුස්සෙකු වන බවත්, පත්කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහකළ හැකි බවත් මා දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————————.

02-541

# පළාත් පාලන නිවේදන

## බණ්ඩාරවෙල මහ නගර සභාව

ගෝඝාතක ආඥාපනත යටතේ කරනු ලබන නිවේදනය

ගෝඝාතක ආඥාපනතේ 13(1) අ වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නියමිත අධිකාරි තැන වන බණ්ඩාරවෙල මහ නගර සභාවේ නගරාධිපති එල්. ඩබ්. චමින්ද විජේසිරි වන මම 2015 වර්ෂයේ බණ්ඩාරවෙල මහ නගර සභා සීමාව තුළ පිහිටි මෙහි පහත උපලේඛනයේ සඳහන් වන දිනයන්හි දී මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

එල්. ඩබ්. චමින්ද විජේසිරි,
නගරාධිපති,
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2015 ජනවාරි මස 12 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | |
|---|---|
| 2015 ජනවාරි 04 ඉරිදා | දුරුතු පුර පසලොස්වක පෝය දිනය |
| 2015 ජනවාරි 15 බ්‍රහස්පතින්දා | තෛපොංගල් දිනය |
| 2015 පෙබරවාරි 03 අඟහරුවාදා | නවම් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 පෙබරවාරි 04 බදාදා | ජාතික නිදහස් දිනය |
| 2015 පෙබරවාරි 17 අඟහරුවාදා | මහා සිව රාත්‍රී දිනය |
| 2015 මාර්තු 05 බ්‍රහස්පතින්දා | මැදින් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 අප්‍රේල් 03 සිකුරාදා | බක් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 අප්‍රේල් 03 සිකුරාදා | මහ සිකුරාදා |
| 2015 අප්‍රේල් 13 සඳුදා | සිංහල දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය |
| 2015 අප්‍රේල් 14 අඟහරුවාදා | සිංහල දෙමළ අලුත් අවුරුදු දිනය |
| 2015 මැයි 03 ඉරිදා | වෙසක් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 මැයි 04 සඳුදා | වෙසක් පුර පසලොස්වක පෝය දිනට පසු දිනය |
| 2015 ජූනි 02 අඟහරුවාදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 2015 ජූලි 01 බදාදා | අධි ඇසළ පුර පසලොස්වක පෝය දිනය |
| 2015 ජූලි 31 සිකුරාදා | ඇසළ පුර පසලොස්වක පෝය දිනය |
| 2015 අගෝස්තු 29 සෙනසුරාදා | නිකිණි පුර පසලොස්වක පෝය දිනය |
| 2015 සැප්තැම්බර් 27 ඉරිදා | බිනර පුර පසලොස්වක පෝය දිනය |
| 2015 ඔක්තෝබර් 04 ඉරිදා | ලෝක සත්ත්ව දිනය |
| 2015 ඔක්තෝබර් 27 අඟහරුවාදා | වප් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 නොවැම්බර් 10 අඟහරුවාදා | දීපවාලි උත්සව දිනය |
| 2015 නොවැම්බර් 25 බදාදා | ඉල් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 දෙසැම්බර් 24 බ්‍රහස්පතින්දා | උඳුවප් පුර පසලොස්වක පෝය දිනය |

02-390

**මාතර ප්‍රාදේශීය සභාව**

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මාතර ප්‍රාදේශීය සභාව විසින් 2014.11.21 වන දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 05:2:2 දරන යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2014 නොවැම්බර් මස 21 වන දින,
මාතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියෙන් (1) වන උපවගන්තියෙන් (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.08.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද, සම්මත අතුරු ව්‍යවස්ථා/සම්මත අතුරු ව්‍යවස්ථාවල මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සිසිල්බීම කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කොණ්ඩා සැකසීමේ සථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පිහිණුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථා, අයිස් කර්මාන්තශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බත්කඩ, ආපන ශාලා සහ තේ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා, හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ආදාහනාගාර විධිමත් කිරීම පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මෘත දේහයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම, පොදු වෙළඳපොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා අංක 01 සිට අංක 27 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පලකරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට, ඉහත කී පළාත්පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මාතර ප්‍රාදේශීය සභාව විසින් 2014.11.21 වන දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී ඒකමතිකව සභා සම්මත වූ වගයි.

02-308

---

**පාතදුම්බර ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා ගවමස්, එළුමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඒ ස්ථානයන්හි ගවමස්, එළු මස් වෙළඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර ලබාගැනීමට ඉදිරිපත් ව සිටින බව ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් (දාහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරුවන් වෙත අදාළ ව්‍යාපාර ස්ථානවල වෙළඳාම කරගෙන යාම සඳහා 2015.02.01 සිට 2015.12.31 වැනි දින දක්වා බලපත්‍ර ලබාදීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්. එම්. එස්. එස්. බී. වෙලගෙදර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 23 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම* | *වෙළඳාම් කරන ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|
| 01. එස්. ජී. එම්. හුසේන් මයා | අංක 48/03, උඩතලවින්න, මඩිගේ | ගවමස් |

02-255

**කළුතර ප්‍රාදේශීය සභාව**

ත්‍රී රෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(VII) වැනි උපවගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 122 වැනි වගන්තියේ විධිවිධාන අනුව කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලදුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1725/16 සහ 2011 සැප්තැම්බර් මස 29 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1760 සහ 2014 මැයි මස 25 දිනැති *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත ත්‍රිරෝද රථ නවතා තැබීමේ ස්ථාන හා නවතා තැබීමට හැකි උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව ඇතුලත් උපලේඛනයට පහත සඳහන් ස්ථාන ඇතුලත් විය යුතු බවට 2014.03.26 දිනැති මහ සභා තීරණ අංක 8.:2:.2 හා 2014.10.23 දිනැති මහ සභා තීරණ අංක 8:2:2 යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ලක්ෂ්මන් විදානපතිරණ,
සභාපති,
කළුතර ප්‍රාදේශීය සභාව.

2014 ජනවාරි මස ,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංක* | *නවතා තබන ස්ථාන* | *එකවර නවතා තැබිය හැකි රථ සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | සිතුම් සෙවන හන්දිය ත්‍රී රෝද රථ ගාල | 03 |
| 02 | ගෝනදූව පිරවුම්හල ඉදිරිපිට ත්‍රී රෝද රථ ගාල | 02 |
| 03 | පනාපිටිය මාතෘ සායනය අසල ත්‍රී රෝද රථ ගාල | 03 |

02-304

---

**මහරගම නගර සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ 2006.09.01 දිනැති අංක 1461 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පිටු අංක 1045 හි උපලේඛනයේ අංක 14 යටතේ පළකරන ලද පහත සඳහන් මාර්ගය සභාව සතු මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

| *පාරේ නම* | *මායිම් සීමාව සිට දක්වා* | *දිග අඩි* | *පළල අඩි* |
|---|---|---|---|
| දෙපානම කැන්දහේනවත්ත එක්සත් මාවත | අංක 5/12 සිට | 1632 | 10 |

(2) එම උපලේඛනයේ සඳහන් අනෙක් සියලුම මංමාවත් සභාව සතු මංමාවත් ලෙස ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වන බව මෙයින් නිවේදනය කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

02-462

# විවිධ දැන්වීම්

## මහියංගණ ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා ගලිබවුසරය ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මහියංගණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2014 වර්ෂයේ අගෝස්තු මස 26 වැනි දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතෙන් මහියංගණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මහියංගණ ප්‍රාදේශීය සභාවට පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2015 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බව යෝජනා කරමි.

*ගලිබවුසරය ලබා දීම සඳහා ගාස්තු :*

මහියංගණ නගර සීමාව තුළ (ප්‍රාදේශීය සභාවේ සිට කි. මී. 3ක් ඇතුළත)

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | පළමු බවුසර් ලෝඩ් 01 සඳහා | 6,000 0 |
| 02. | ඊට වැඩිවන සෑම බවුසර් ලෝඩ් එකක් සඳහා | 5,000 0 |
| 03. | සේවා ගාස්තු : | 1,000 0 |
| | (i) අධීක්ෂණ ගාස්තු දිනකට | 750 0 |
| | (ii) කම්කරුවෙකුට දිනකට | 500 0 |
| | (iii) රියදුරු ගාස්තු දිනකට | 750 0 |
| 04. | ප්‍රවාහනය කි. මී. 01ක් සඳහා | 50 0 |

මහියංගණ නගර සීමාවෙන් පිටත (ප්‍රාදේශීය සභාවේ සිට කි. මී, 3ක් එපිට)

| | | |
|---|---|---|
| 01. | පළමු බවුසර් ලෝඩ් 01 සඳහා | 4,000 0 |
| 02. | ඊට වැඩිවන සෑම ලෝඩ් 01 ක් සඳහා | 3,000 0 |
| 03. | සේවා ගාස්තු : | 1,000 0 |
| | (i) අධීක්ෂණ ගාස්තු දිනකට | 500 0 |
| | (ii) කම්කරුවකුට දිනකට | 400 0 |
| | (iii) රියදුරු ගාස්තු | 400 0 |
| 05. | ප්‍රවාහනය කි. මී. 01 ක් සඳහා | 50 0 |

ඉහත ගාස්තුවලට අමතරව රජයේ බදු මුදල් (වැට්, මුද්දර හා ජාතිය ගොඩනැගීමේ බදු) ද ගෙවිය යුතු ය.

**සැ. යු.** :- භාෂාත්‍රයේ යම් ගැටළුවක් ඇතිවුවහොත් සිංහල අර්ථය වලංගු වේ.

02-254/7

---

## මහියංගණ ප්‍රාදේශීය සභාව

සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ අනුමත කර ඇති හෝටල්, ආපනශාලා, ලැගුම්හල් වලින් ගාස්තු අය කිරීම - 2015 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ මහියංගණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2014 වර්ෂයේ අගෝස්තු මස 26 වැනි දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගණ ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
මහියංගණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වැනි වගන්තිය ප්‍රකාර මහියංගණ ප්‍රාදේශීය සභා පාලන සීමාව තුළ යම් හෝටලයක් ආපන ශාලාවක් හෝ ලැගුම්හලක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නා වූ ද, ඒ හෝටලය, ආපන ශාලාව, ලැගුම්හල (1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා) ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ අනුමත කර ඇති අවස්ථාවක එම හෝටලයේ, ආපන ශාලාවේ හෝ ලැගුම්හලේ එම වර්ෂයට පෙරාතුව වූ වර්ෂය සඳහා වූ ලැබීම්වලට අදාළ වූ එම ලැබීම්වලින් 1% ක (සියයට එකක) ගාස්තුවක් එම හෝටලය, ආපන ශාලාව, ලැගුම්හල පවත්වාගෙන යනු ලබන අය විසින් මෙම සභාව වෙත 2015 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි යෝජනා කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගණ ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
මහියංගණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*සැ.යු.* - භාෂාත්‍රයේ යම් ගැටළුවක් ඇති වුවහොත් සිංහල අර්ථය වලංගු වේ.

---

02-254/6

## මහියංගණ ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් මහියංගණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2014 වර්ෂයේ අගෝස්තු මස 26 වැනි දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගණ ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
මහියංගණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් මහියංගණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මහියංගණ ප්‍රාදේශීය සභාවට පහත

උපලේඛනයේ සඳහන් ගාස්තු 2015 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බව යෝජනා කරමි.

*උපලේඛනය*

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | වීඩී රේඛා අයදුම්පත්‍රයක් | 100 0 |
| 02. | වීඩී රේඛා සහතික නිකුත් කිරීම සඳහා පරීක්ෂණ ගාස්තු | 500 0 |
| 03. | වීඩීරේඛා සහතිකයක් සඳහා | 1,786 0 |
| 04. | පුස්තකාල සාමාජික අයදුම්පත්‍රයක් | 5 0 |
| 05. | පුස්තකාල තැන්පත් ගාස්තුව | 20 0 |
| 06. | පුස්තකාල දඩ (දිනකට) | 50 |
| 07. | සේවා ගාස්තු | 50 0 |
| 08. | වීඩී රේඛා සහතික අළුත් කිරීම සඳහා ගාස්තු | 350 0 |

වීඩීරේඛා අයදුම්පත්‍ර හා වීඩීරේඛා සහතික සඳහා ඉහත ගාස්තුවලට අමතරව රජයේ බදු මුදල් ද , (වැට් මුද්දර හා ජාතිය ගොඩනැගීමේ බදු) ගෙවිය යුතු ය.

*සැ. යු.* - භාෂාත්‍රයේ යම් ගැටළුවක් ඇතිවුවහොත් සිංහල අර්ථය වලංගු වේ.

02-254/4

---

**මහියංගණ ප්‍රාදේශීය සභාව**

විනෝද බදු ආඥාපනත යටතේ බදු අය කිරීම

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ 2014 වර්ෂයේ අගෝස්තු මස 26 වැනි දින පවත්වන ලද මහියංගණ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගණ ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
මහියංගණ ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ එම චිත්‍රපට සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක්, කතුරු ඔන්චිල්ලා, මාරක ළිඳේ මෝටර් සයිකල් ධාවනය, වැනි ඕනෑම සැණකෙළි සංදර්ශන සඳහා මුද්‍රණය කරනු ලබන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 10% ක විනෝද බද්දක් 2015 වර්ෂයට පනවා අය කළ යුතු බව යෝජනා කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගණ ප්‍රාදේශීය සභාව.

***ඉහත සඳහන් සංදර්ශන වෙනුවෙන් පහත සඳහන් ආකාරයෙන් බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු ය :-***

| | | *ගාස්තු රු. ශ.* |
|---|---|---|
| 01. | එක් දිනක් සඳහා ගාස්තු | 100 0 |
| | වැඩිවන සෑම දිනක් සඳහාම දිනකට | 50 0 |
| | උපරිමය | 1,000 0 |
| 02. | අයදුම්පත් ගාස්තුව | 100 0 |

***ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ (176 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ බදු***

ඕනෑම විනෝද සංදර්ශනයකට ඇතුල්වීමේ ගාස්තුව වෙනුවෙන් 15% ක බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු බව දැනුම් දෙමි.

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | ලිත් වර්ෂයකට | 1,000 0 |
| 02. | මාස 06 කට වැඩි කාලයක් සඳහා | 1,000 0 |
| 03. | මාස 06 කට අඩු මාස 03 කට වැඩි කාලයක් සඳහා | 750 0 |
| 04. | මාස 03 කට අඩු මාස 01 කට වැඩි කාලයක් සඳහා | 650 0 |
| 05. | එක් මසකට | 500 0 |
| 06. | දිනකට | 100 0 |
| 07. | අයදුම්පත්‍ර ගාස්තුව | 100 0 |

*සැ. යු.* - භාෂාත්‍රයේ යම් ගැටළුවක් ඇතිවුවහොත් සිංහල අර්ථය වලංගු වේ.

02-254/5

---

**මහියංගණ ප්‍රාදේශීය සභාව**

ජල ගාස්තු අයකිරීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 2 වැනි වගන්තිය යටතේ 1988.08.23 දිනැති අංක 520/7 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ 34 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ මහියංගණ ප්‍රාදේශීය සභාව 2003.03.14 දින අංක 03-209 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ වර්ෂ 2014 අගෝස්තු මස 26 වැනි දින පවත්වන ලද මහියංගණ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගණ ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
මහියංගණ ප්‍රාදේශීය සභාව.

***යෝජනාව***

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන හා ඉඩිකිරීම් අමාත්‍යතුමා විසින් සාදන ලද 1988.08.23 දිනැති *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ 34 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි මහියංගණ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන සියලුම ජල යෝජනා ක්‍රම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2015 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බව යෝජනා කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගන ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
මහියංගණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

*ගෘහස්ත*

| *ඒකක ගණන* | *ඒකකයක මිල රු. ශත* | *මාසික සේවා ගාස්තු රු. ශත* |
|---|---|---|
| 1 සිට 10 | 20 0 | 100 0 |
| 11 සිට 20 | 25 0 | |
| 21 සිට 30 | 30 0 | |
| 31 සිට 40 | 35 0 | |
| 41 සිට 50 | 40 0 | |
| 51 සිට 60 | 45 0 | |
| 61 සිට 70 | 50 0 | |
| 71 සිට 80 | 55 0 | |
| 81 සිට 90 | 60 0 | |
| 91 සිට 100 | 65 0 | |
| 100 ට වැඩි | 70 0 | |

*පාසල් සහ පූජනීය ස්ථාන*

| *ඒකක ගණන* | *ඒකකයක මිල රු. ශත* | *මාසික සේවා ගාස්තු රු.ශත* |
|---|---|---|
| 1 සිට 50 | 20 0 | 100 0 |
| 51 සිට 60 | 25 0 | |
| 61 සිට 70 | 30 0 | |
| 71 සිට 80 | 35 0 | |
| 81 සිට 90 | 40 0 | |
| 91 සිට 100 | 45 0 | |
| 100ට වැඩි | 50 0 | |

*වාණිජ කර්මාන්ත හා සාප්පු*

| *ඒකක ගණන* | *ඒකකයක මිල රු. ශත* | *මාසික සේවා ගාස්තු රු. ශත* |
|---|---|---|
| 1 සිට 10 | 35 0 | 100 0 |
| 11 සිට 20 | 40 0 | |
| 21 සිට 30 | 45 0 | |
| 31 සිට 40 | 50 0 | |
| 41 සිට 50 | 55 0 | |
| 51 සිට 60 | 60 0 | |
| 61 සිට 70 | 65 0 | |
| 71 සිට 80 | 70 0 | |
| 81 සිට 90 | 75 0 | |
| 91 සිට 100 | 80 0 | |
| 100ට වැඩි | 85 0 | |

*බවුසර් මගින් ජලය සැපයීම*

| | *රු. ශත* |
|---|---|
| එක ඒකකයක් සඳහා | 70 0 |
| නව ජල සම්බන්ධතාවයක් සඳහා අයකරන ගාස්තු : | |
| ගෘහස්ත | 5,000 0 |
| පාසල් සහ පූජනීය ස්ථාන | 5,000 0 |
| වානිජ කර්මාන්ත හා සාප්පු | 7,000 0 |

- මීටරය ක්‍රියා විරහිත වී තිබෙන විට හෝ මීටරය අස්ථානගත වී ඇති අවස්ථාවල දී ජලය සඳහා මසකට රු. 500 ක ස්ථාවර ගාස්තු මාස්පතා අය කෙරේ.
- ජල සම්බන්ධතාවය වෙනත් අයෙකුට පැවරීමේ දී රු. 200 ක ගාස්තුවක් අය කෙරේ.
- ජල සැපයුම් සඳහා ගෙවීම් පැහැර හැරීමේ දී ජල සැපයුම් විසන්ධි කර නැවත සන්ධි කිරීමේ දී රු. 750 ක ගාස්තුවක් අය කෙරේ.

02-254/2

---

### මහියංගණ ප්‍රාදේශීය සභාව

මහියංගණ ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමරවල බදු අයිතිය පැවරීමේ දී ගාස්තු අයකිරීම - 2015 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මහියංගන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2014 වර්ෂයේ අගෝස්තු මස 26 වැනි දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ් එම්. සුනිල්,
සභාපති,
මහියංගණ ප්‍රාදේශීය සභාව.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් මහියංගණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මහියංගණ ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමරවල බදු අයිතිය පැවරීමේ දී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2015 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බව යෝජනා කරමි.

*උපලේඛනය*

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | පැරණි පුද්ගලික බස් නැවතුම්පොල අසල කුටි කාමරයක් සඳහා | 5,000 0 |
| 02. | බදුල්ල පාර පූජානගරය කඩ කාමරයක් සඳහා | 10,000 0 |
| 03. | පොදු වෙළඳපොල කඩ කාමරයක් සඳහා | 25,000 0 |
| 04. | බදුල්ල පාර කඩ කාමරයක් සඳහා | 30,000 0 |
| 05. | පැරණි පොදු වෙළඳපොල කඩ කාමරයක් සඳහා | 30,000 0 |
| 06. | පුද්ගලික බස්නැවතුම්පොල ඉදිරිපිට කඩ කාමරයක් සඳහා | 30,000 0 |
| 07. | පදියතලාව පාර කඩ කාමරයක් සඳහා | 30,000 0 |
| 08. | පුද්ගලික බස්නැවතුම්පල අසල කඩ කාමර (කඩ 31) සඳහා | 30,000 0 |
| 09. | සී.ටී.බී. බස්නැවතුම්පල ඉදිරිපිට කඩ කාමර සඳහා | 30,000 0 |
| 10. | විදානගමගේ වෙළඳසංකීර්ණයේ කඩකාමර සඳහා | 30,000 0 |
| 11. | සී.ටී.බී. බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ කඩකාමර සඳහා | 50,000 0 |

***සැලකිය යුතුයි.*** - භාෂාත්‍රයේ යම් ගැටළුවක් ඇතිවුවහොත් සිංහල අර්ථය වලංගු වේ.

02-254/3

---

### මහියංගන ප්‍රාදේශීය සභාව

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම - 2015 වර්ෂය

1988 අංක 56 දරන පනතින් හා 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය අනුව

2014 වර්ෂයේ අගෝස්තු මස 26 වැනි දින පවත්වන ලද මහියංගන ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගන ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
මහියංගන ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1988 අංක 56 දරන පනතින් හා 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් මා වෙත පවරා ඇති බලතල අනුව මහියංගන ප්‍රාදේශීය සභා සීමාව තුළ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන අමුණා ඇති උපලේඛනයේ දැක්වෙන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ සහ එකී සංශෝධිත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව එකී ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලබන්නන් 2015.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉදිරියට අවුරුදු තුනකට (03)කට රුපියල් හාරදහසක රු. 4000 ක බලපත්‍ර ගාස්තුවක් හා ඊට වැට් බද්ද, එකී ක්‍රියාකාරකම්වලට අදාළ වන මූලික ආයෝජන මත පදනම් වූ පරීක්ෂණ ගාස්තුවක් හා එයට වැට් බද්ද හා මුදල් මෙම ප්‍රාදේශීය සභාව වෙත ගෙවා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු බව යෝජනා කරමි.

***පරීක්ෂණ ගාස්තු අයකිරීම***

| *ආයෝජනය රුපියල්* | *පරීක්ෂා කිරීමේ ගාස්තු රු. ශත* | *මුළු මුදල රු. ශත* |
|---|---|---|
| 01. රු. 2,50,000 හෝ ඊට අඩු | 3,000 + වැට් බද්ද + මුද්දර ගාස්තු | 3,660 0 |
| 02. රු. 2,50,001 සිට රු. 5,00,000 දක්වා | 3,750 + වැට් බද්ද + මුද්දර ගාස්තු | 4,575 0 |
| 03. රු. 5,00,001 සිට රු. 10,00,000 දක්වා | 5,000 + වැට් බද්ද + මුද්දර ගාස්තු | 6,100 0 |
| 04. රු. 10,00,000 ට වැඩි | 10,000 + වැට් බද්ද + මුද්දර ගාස්තු | 12,200 0 |

*උපලේඛනය 1*

1. 1988 අංක 56 දරන පනතින් හා 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1523/16 දරන වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 25 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 'ඇ' කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙහි දෙවැනි උපලේඛනයේ සඳහන් ක්‍රියාපටිපාටියට අනුව ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, අවලංගු කිරීම, ප්‍රතික්ෂේප කිරීම සහ අත්හිටුවීම.

1. සියලුම වාහන ඉන්ධන පිරවුම්හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු)
2. වියලි ක්‍රියාවලි සහිත වී මෝල්
3. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 1,000 කට අඩුවන ඇඹරුම්හල්
4. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
5. උළු සහ ගඩොල් කර්මාන්ත
6. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600 ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු, මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැණීම්
7. දිනකට ඝන මීටර් 50 ට අඩු දැව ඉරුම් ධාරිතාවක් ඇති ලී මෝලක් හෝ බෝරෝන් පිපිරීම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
8. බහුකාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
9. නේවාසික කාමර 05 හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්
10. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවිකිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදුකරන ගරාජ හැර අනිකුත් වාහන අළුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ
11. ශීතකරණ හා වායු සමන යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවිකිරීම සිදුකරන ස්ථාන
12. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක්, සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිඳීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. දුම්කොළ වේලීමේ කර්මාන්ත
16. සල්ෆර් දුම්ගැසීම සහිත එක් ක්‍රියාවලියකදී නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 500 ක් හෝ එයට වැඩි ධාරිතාවයක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
17. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
18. ක්‍ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
19. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
20. දිනකට මෙට්‍රික් ටොන් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු
21. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
22. සියලු බෙලිකටු ඇසිරීමේ කර්මාන්ත
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලුම් පර්යන්ත
24. සේවකයින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල හා අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

*සැ. යු.* - භාෂාත්‍රයේ යම් ගැටළුවක් ඇතිවුවහොත් සිංහල අර්ථය වලංගු වේ.

02-254/1

---

**මහියංගන ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ මහියංගන ප්‍රාදේශීය

සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2014 වර්ෂයේ අගෝස්තු මස 26 වැනි දින පවත්වන ලද මහියංගන ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගන ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
මහියංගන ප්‍රාදේශීය සභාව.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 148 වැනි වගන්තිය යටතේ මහියංගන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මහියංගන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තකුගෙන්ම එහි II වැනි තීරුවේ නිරූපිත බද්දක් 2015 වර්ෂය සඳහා අයකළ යුතු යැයි යෝජනා කරමි.

### *උපලේඛනය*

| *අනු. අංකය* | *I වැනි තීරුව* | *II වැනි තීරුව රු. ශත* |
|---|---|---|
| 1. | මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, සයිකලයක්, කරත්තයක්, අත්කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක්,හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |
| 2. | සෑම සයිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් සඳහා | |
| | *(අ)* එය වෙළඳ කටයුත්තක් සඳහා භාවිතා කරන්නේ නම් | 18 0 |
| | *(ආ)* එය වෙළඳ කටයුතු නොවන කටයුතු සඳහා භාවිතා කරන්නේ නම් | 4 0 |
| 3. | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| 4. | සෑම අත්කරත්තයක් සඳහා | 10 0 |
| 5. | සෑම රික්ෂෝවක් සඳහා | 7 0 |

ඉහත ගාස්තුවලට අමතරව රජයේ බදු මුදල් ද (වැට් මුද්දර හා ජාතිය ගොඩනැගීමේ බදු) ගෙවිය යුතු ය.

*සැ. යු.* - භාෂාත්‍රයේ යම් ගැටළුවක් ඇතිවුවහොත් සිංහල අර්ථය වලංගු වේ.

02-254/8

---

## මහියංගන ප්‍රාදේශීය සභාව

වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම - 2015 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (ආ) හා 148 වැනි වගන්ති යටතේ මහියංගන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2014 වර්ෂයේ අගෝස්තු මස 26 වැනි දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සුනිල්,
සභාපති,
මහියංගන ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
මහියංගන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (ආ) හා 148 වැනි වගන්ති යටතේ මහියංගන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මහියංගන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත යම් වාහනයක් නවතා තැබීම සඳහා II තීරුවේ සඳහන් ගාස්තු 2015 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

### *උපලේඛනය*

| *අනු. අංකය* | *1 වන තීරුව වාහන වර්ගය* | *II වන තීරුව ලියාපදිංචි ගාස්තු රු. ශත* | *මාසිකව ගෙවිය යුතු මුදල රු. ශත* |
|---|---|---|---|
| 01. | බස් රථයක් සඳහා | 1,000 0 | 500 0 |
| 02. | ලොරි රථයක් සඳහා | 750 0 | 200 0 |
| 03. | වෑන් රථයක් සඳහා | 1,000 0 | 200 0 |
| 04. | ට්‍රැක්ටර් රථයක් සඳහා | 500 0 | 100 0 |
| 05. | ත්‍රිරෝද රථයක් සඳහා | 100 0 | 50 0 |

ඉහත ගාස්තුවලට අමතරව රජයේ බදු මුදල් ද (වැට් මුද්දර හා ජාතිය ගොඩනැගීමේ බදු) ගෙවිය යුතුය.

සැ. යු. - භාෂාත්‍රයේ යම් ගැටළුවක් ඇතිවුවහොත් සිංහල අර්ථය වලංගු වේ.

02-254/9

---

## තඹලගමුව ප්‍රාදේශීය සභාව - මොල්ලිපොතාන

ව්‍යාපාර බලපත්‍ර ගාස්තු - 2015 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 152, 159 (1), (20),152 1 (1),(2) 153 (1) හා 154 වැනි වගන්ති ප්‍රකාරව තඹලගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම්වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ද,

ඇතැම් විෂයයෙහි වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බද්දක් ද, ඇතැම් වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් වූ පසුගිය වර්ෂයේ ආදායම මත පදනම් වූ වාර්ෂික බද්දක් ද 2014.11.14 දින පැවැති සභා තීරණයට අනුව 2015 වර්ෂය සඳහා පනවා අය කරන බවත්, එකී බලපත්‍ර ගාස්තු හා බදු 2015.03.31 දිනට ප්‍රථම මෙම සභාවට ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීනි මුහම්මදු සුෆියාන්,
සභාපති,
තඹලගමුව ප්‍රාදේශීය සභාව.

**උපලේඛන අංක 01**

***බලපත්‍ර ගාස්තු - 149 වැනි වගන්තිය***

*ව්‍යාපාරයේ ස්වභාවය - 2015*

| *අනු. අංකය* | *විස්තරය* | *වාර්ෂික වටිනාකම රු. 3,000ට අඩු රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 4,000ට අඩු රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 15,000 ට අඩු රු. ශත* |
|---|---|---|---|---|
| 1. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 500 0 |
| 2. | කෑම කඩ සඳහා | 400 0 | 500 0 | 1,000 0 |
| 3. | තේ හා කෑම කඩ සඳහා | 300 0 | 350 0 | 500 0 |
| 4. | බේකරි සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | දර විකුණන ස්ථාන | 150 0 | 200 0 | 300 0 |
| 6. | ලී අලෙවිසැල් | 1,000 0 | 3,000 0 | 5,000 0 |
| 7. | සත්ව ආහාර අලෙවිසල් | 400 0 | 500 0 | 550 0 |
| 8. | සැලුන් සඳහා | 100 0 | 250 0 | 500 0 |
| 9. | බීඩි සුරුට්ටු නිෂ්පාදන ආයතන | 125 0 | 150 0 | 200 0 |
| 10. | මස්කඩ සඳහා | 125 0 | 250 0 | 500 0 |
| 11. | ජංගම මාළු වෙළඳාම | 100 0 | 250 0 | 500 0 |
| 12. | වීඩියෝ හල් සඳහා | 400 0 | 500 0 | 1,000 0 |
| 13. | හස්ත මුද්‍රණ ආයතන සඳහා | 200 0 | 300 0 | 500 0 |
| 14. | මුද්‍රණ ආයතන සඳහා | 500 0 | 750 0 | 1,500 0 |
| 15. | රන්රිදී අලෙවිසල් සඳහා | 800 0 | 1,500 0 | 2,000 0 |
| 16. | යකඩ බඩු සඳහා | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 17. | වඩු මඩු සඳහා | 850 0 | 1,000 0 | 2,000 0 |
| 18. | කළුගල් එක්රැස් කරන ස්ථාන සඳහා | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 19. | කළුගල් වලවල් සඳහා | 5,000 0 | 7,000 0 | 10,000 0 |
| 20. | මෝටර් වාහන සේවා ස්ථාන | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 21. | චින්කල් සඳහා | 150 0 | 200 0 | 250 0 |
| 22. | විදුලි ලී මෝල් සඳහා | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 23. | සාමාන්‍ය ලී මෝල් සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 24. | ටයර් ටියුබ් අලෙවිසල් සඳහා | 400 0 | 600 0 | 1,000 0 |
| 25. | විදුලි කාර්මික ස්ථාන සඳහා | 400 0 | 450 0 | 500 0 |
| 26. | පරිගණක මධ්‍යස්ථාන සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 27. | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම | 900 0 | 950 0 | 5,000 0 |
| 28. | කොමිනිකේෂන් (දුරකථන මධ්‍යස්ථාන) | 300 0 | 350 0 | 500 0 |
| 29. | වෙළඳ දැන්වීම් පුවරු සඳහා (වර්ග අඩි 01) | | | 80 0 |
| 30. | පාර පළුදු කිරීම (තාර පාර කැපීම සඳහා) | 600 0 | 750 0 | 1,000 0 |
| 31. | ත්‍රිරෝද රථ අළුත්වැඩියා කරන ස්ථාන | 500 0 | 600 0 | 700 0 |
| 32. | මල්පෝච්චි | 300 0 | 350 0 | 500 0 |
| 33. | සිල්ලර කඩ | 300 0 | 350 0 | 500 0 |
| 34. | පැරණි භාණ්ඩ අලෙවිසල් | 300 0 | 350 0 | 400 0 |
| 35. | සිමෙන්ති අලෙවිසල් | 1,000 0 | 1,200 0 | 2,000 0 |
| 36. | උළු, ගඩොල් අලෙවිසල් | 600 0 | 1,000 0 | 1,200 0 |
| 37. | උළු, ගඩොල් නිෂ්පාදන ස්ථාන | 200 0 | 250 0 | 500 0 |
| 38. | මාල වළලු ආදී වෙළඳ ස්ථාන | 300 0 | 350 0 | 500 0 |
| 39. | කඩල හා මික්ෂර් නිෂ්පාදන ආයතන | 350 0 | 400 0 | 500 0 |
| 40. | අයිස්ක්‍රීම් නිපදවන ස්ථාන | 250 0 | 300 0 | 500 0 |
| 41. | ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි ස්ථාන | 400 0 | 450 0 | 600 0 |
| 42. | අයිස්ක්‍රීම් වෙළඳසැල් | 250 0 | 300 0 | 350 0 |
| 43. | ලොන්ඩ්‍රි සඳහා | 100 0 | 150 0 | 200 0 |
| 44. | මෝටර් වාහන ගරාජ් | 900 0 | 950 0 | 1,000 0 |

| *අනු. අංකය* | *විස්තරය* | *රු. 3,000ට අඩු*<br>*රු. ශත* | *රු. 4,000ට අඩු*<br>*රු. ශත* | *රු. 15,000 ට අඩු*<br>*රු. ශත* |
|---|---|---|---|---|
| 45. | හාල් මෝල් සඳහා | 800 0 | 900 0 | 1,000 0 |
| 46. | හාල් මෝල් (කොටා) | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 47. | මෝටර් වාහන අමතර කොටස් අලෙවිසැල් | 1,000 0 | 1,200 0 | 1,500 0 |
| 48. | තහඩු ආශ්‍රිත වැඩපල සඳහා | 400 0 | 450 0 | 500 0 |
| 49. | වෙල්ඩින් වැඩපල සඳහා | 800 0 | 900 0 | 1,000 0 |
| 50. | විදුලි උපකරණ විකුණන ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | ඡායාරූප ශාලා සඳහා | 350 0 | 400 0 | 500 0 |
| 52. | ඡායා පිටපත්හල් සඳහා | 250 0 | 300 0 | 350 0 |
| 53. | ඉන්ධන පිරවුම්හල් සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 54. | කෘෂි රසායන අලෙවිසල් සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 55. | ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා | 350 0 | 400 0 | 450 0 |
| 56. | පෞද්ගලික බෙහෙත් ශාලා සඳහා | 1,000 0 | 2,500 0 | 3,000 0 |
| 57. | මස්කටු අලෙවිසල් සඳහා | 150 0 | 200 0 | 300 0 |
| 58. | කුකුල් ආහාර අලෙවිසල් සඳහා | 300 0 | 350 0 | 500 0 |
| 59. | යතුරුපැදි අළුත්වැඩියා කරන ස්ථාන | 350 0 | 500 0 | 550 0 |
| 60. | මුද්‍රවපු කිරි අලෙවිසල් | 1,000 0 | 1,200 0 | 1,500 0 |
| 61. | යතුරුපැදි අමතර කොටස් අලෙවි කරන ස්ථාන | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 62. | බ්ලොක් ගල් වැඩපල | 1,000 0 | 2,000 0 | 5,000 0 |
| 63. | ලියාපදිංචි මත්පැන් අලෙවිසල් | 15,000 0 | 20,000 0 | 25,000 0 |
| 64. | රෙදි හා නිමි ඇඳුම් අලෙවිසල් | 2,000 0 | 3,000 0 | 4,000 0 |
| 65. | ඇඳුම් මසන (ටේලර්) ස්ථාන | 300 0 | 350 0 | 400 0 |
| 66. | පොත් හා පත්තර අලෙවිසල් | 650 0 | 700 0 | 750 0 |
| 67. | නිල මුද්‍රා හා නාම පුවරු සකස් කරන ස්ථාන | 300 0 | 400 0 | 500 0 |
| 68. | ඔරලෝසු අළුත්වැඩියා කරන ස්ථාන | 150 0 | 200 0 | 250 0 |
| 69. | ගෘහ භාණ්ඩ කුලියට දෙන ස්ථාන | 250 0 | 350 0 | 1,000 0 |
| 70. | සහල් වෙළඳසල් සඳහා | 500 0 | 550 0 | 1,000 0 |
| 71. | පොල් අලෙවිසල් සඳහා | 300 0 | 350 0 | 400 0 |
| 72. | කුෂන් වැඩපල සඳහා | 900 0 | 950 0 | 1,000 0 |
| 73. | එළු මස් කඩ සඳහා | 400 0 | 450 0 | 500 0 |
| 74. | වී මිලදී ගන්නා ස්ථාන හා ගබඩා කරන ස්ථාන සඳහා | 2,000 0 | 3,000 0 | 3,000 0 |
| 75. | එළවළු අලෙවිසල් සඳහා | 200 0 | 250 0 | 300 0 |
| 76. | යකඩ කම්හල් සඳහා | 300 0 | 350 0 | 400 0 |
| 77. | රන්, රිදී බඩු අළුත්වැඩියා කරන ස්ථාන | 300 0 | 350 0 | 500 0 |
| 78. | ටයර් වැඩපල සඳහා | 300 0 | 350 0 | 500 0 |
| 79. | ගල් ක්‍රෂර් සඳහා | 5,000 0 | 7,500 0 | 10,000 0 |
| 80. | පාසල් බෑග් සැකසීම හා අලෙවි කිරීම | 250 0 | 300 0 | 400 0 |
| 81. | ගොඩනැගිලි අයදුම්පත් නිකුත් කිරීම | 300 0 | 500 0 | 1,000 0 |
| 82. | රජයේ හෝ පෞද්ගලික බැංකු සඳහා | 2,500 0 | 3,500 0 | 6,000 0 |
| 83. | විදුලි සන්නිවේදන කුළුණු සඳහා (වසරකට) | | | 25,000 0 |
| 84. | පරිසර බලපත්‍ර | | | 3000 0 |
| 85. | ඇලුමිනියම් බඩු සඳහා | 350 0 | 500 0 | 650 0 |
| 86. | ඉඩම් බලපත්‍ර මාරු කිරීම සඳහා | | | 1,000 0 |
| 87. | ඉඩම්, ගොඩනැගිලි බදු දීම | | | 2,000 0 |
| 88. | සභාව මගින් නිකුත් කරනු ලබන සහතික සඳහා | | | 1,000 0 |
| 89. | සමුපකාර ශාඛා | | 500 0 | 1,000 0 |
| 90. | ත්‍රිරෝද රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 500 0 | 600 0 |
| 91. | විදේශ රැකියා ආයතන පිහිටුවීම | | | 5,000 0 |
| 92. | ජංගම දුරකථන අලෙවිසල් | | | 1,000 0 |
| 93. | තොග කඩ | | | 3,000 0 |
| 94. | සභා බල ප්‍රදේශයේ බොරළු, කළු ගල්, පස් ප්‍රවාහනය කිරීමේ ගාස්තු (කියුබ්1) | | (කියුබ් 1) | 50 0 |
| 95. | ගොයම් කපන මැෂිම | | | 5,000 0 |
| 96. | ගොයම් මඩින යන්ත්‍රය | | (කියුබ් 1) | 2,000 0 |
| 97. | වැලි පැටවීමේ කියුබ් 01 | | | 100 0 |
| 98. | ලොතරැයිපත් අලෙවිසල් සඳහා | 100 0 | 200 0 | 500 0 |
| 99. | පැළ විකිණීමේ වෙළඳසල් | 200 0 | 300 0 | 400 0 |
| 100. | ට්‍රැක්ටර් රථ ප්‍රවාහන කටයුතුවල දී සභා බල ප්‍රදේශයේ අතුරු මාර්ග පාවිච්චි කිරීම සඳහා | | | 300 0 |

| *අනු. අංකය* | *විස්තරය* | *රු. 3,000ට අඩු* *රු. ශත* | *රු. 4,000ට අඩු* *රු. ශත* | *රු. 15,000 ට අඩු* *රු. ශත* |
|---|---|---|---|---|
| 101. | උත්සව භාණ්ඩ කුලියට දීම | 300 0 | 400 0 | 500 0 |
| 102. | වීදුරු කඩ | 300 0 | 400 0 | 600 0 |
| 103. | කේබල් සම්බන්ධතා | 900 0 | 950 0 | 1,000 0 |
| 104. | පාවහන් කඩ | 300 0 | 400 0 | 500 0 |
| 105. | ජංගම දුරකථන සඳහා රීලෝඩ් කරන ස්ථාන | 100 0 | 150 0 | 200 0 |
| 106. | පළතුරු කඩ | 200 0 | 250 0 | 300 0 |
| 107. | ඇඟලුම් කර්මාන්ත | 2,500 0 | 4,000 0 | 5,000 0 |
| 108. | කුකුල් මස් අලෙවිසල් | 500 0 | 1,000 0 | 3,000 0 |
| 109. | පෞද්ගලික උපකාර පංති සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 110. | ලියාපදිංචි කර ඇති හා ලියාපදිංචි නොකළ වාහන අලෙවිසැල් | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 111. | මස් සඳහා ඇති කරන කුකුල් ගොවිපලවල් සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 112. | රූපලාවන්‍ය කටයුතු සිදු කරන ස්ථාන/මනාලියන් හැඩගන්වන ස්ථාන සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 113. | ඇස් පරීක්ෂා කරන ස්ථාන/ඇස් කණ්නාඩි අලෙවිසල් | 500 0 | 700 0 | 1,000 0 |
| 114. | නීතිඥ කාර්යාල/රෙජිස්ට්‍රාර් කාර්යාල | 500 0 | 700 0 | 1,000 0 |
| 115. | හරක් කැපීමේ ගාස්තු | | (1 හරකෙක් සඳහා) | 500 0 |
| 116. | වීථි රේඛා සහතික නිකුත් කිරීම සඳහා | | | 3,000 0 |
| 117. | පොළව කැනීම් කිරීම සඳහා | | | 1,500 0 |

02-253

---

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

2015 වර්ෂයට අදාළව පහත ගාස්තු පැනවීම සංශෝධනය කිරීම

2014.12.26 දින පළ කරන ලද අංක 1,895 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටසේ පළ කරන ලද ගාස්තුවලින් පහත සඳහන් ගාස්තු සංශෝධනය කරන ලදී :

| | | *රු. ශත* |
|---|---|---|
| 1. | වීථි රේඛා සහතික නිකුත් කිරීම (ලොට් 01කට) | 500 0 |
| 2. | අනතුරුදායක ගස් ඉල්ලුම්පත්‍ර ගාස්තු | 250 0 |
| 3. | ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු | 750 0 |

2015 ක් වූ ජනවාරි මස 28 වැනි දින,

ඩී. ඒ. ධර්මසේන,
සභාපති,
මහනුවර කඩවත් සතර සහ
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව.

02-381

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.